<u>ශ්‍රී ලංකා වරාය අධිකාරිය</u>

මගේ අංකය: වඅධි/ප්‍ර01/චක්‍රලේඛ/2025

**වරාය අධිකාරිය චක්‍රලේඛ අංකය : 13/2025**

**සියළුම අධ්‍යක්ෂවරුන්**
**සියළුම කොට්ඨාශ ප්‍රධානීන්/ අංශ ප්‍රධානීන්**

**<u>රාජකාරී කටයුතු සඳහා යෙදෙන නිලධාරීන්/ සේවකයින් සඳහා නවාතැන් පහසුකම් ලබා දීම</u>**

කොළඹ වරායේ සේවය කරනු ලබන නිලධාරීන් / සේවකයින් විවිධ රාජකාරී අවශ්‍යතාවයන් සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලට යැමට සිදු වන අවස්ථා ඇත. විශේෂයෙන්ම ගාල්ල හා ත්‍රිකුණාමලය වරායන්වල නඩත්තු කටයුතු මෙන්ම වෙනත් විවිධ රාජකාරීන් සඳහා කොළඹ වරායේ නිලධාරීන් හා සේවකයින් යෙදවීමට කටයුතු කරනු ලැබේ. ඊට අමතරව නඩු කටයුතු හා මිනුම් කටයුතු වෙනුවෙන් ඔලුවිල්, ත්‍රිකුණාමලය හා ගාල්ල වැනි ප්‍රදේශ වලට යැමට සිදු වේ.

ඉහත සඳහන් රාජකාරී අවශ්‍යතාවයන් සඳහා යොදවන නිලධාරී/ සේවකයින්ට අවශ්‍ය නවාතැන් පහසුකම් සඳහා වරාය අධිකාරිය යටතේ පවතින සංචාරක බංගලාවල කාමර චක්‍රලේඛ අංක 01/2025 ට අනුව,ලබා දීමට කටයුතු කළද ඇතැම් අවස්ථාවලදී එම සංචාරක බංගලාවල කාමර ලබා දීමේදී අපහසුතාවයන් ඇති වේ.

එම අපහසුතාවයන් වළක්වා ගැනීම සඳහා රාජකාරී කටයුතු සඳහා යොදවා ඇති නිලධාරීන් / සේවකයින්ට පහත පරිදි නවාතැන් පහසුකම් ලබා දීමට කටයුතු සලසා ඇති බැවින් ඒ අනුව ක්‍රියාකරන ලෙස දන්වනු ලැබේ.

1. වරාය අධිකාරියේ 01/2025 චක්‍රලේඛයේ අංක 20 හි සඳහන් පරිදි සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ අනුමැතිය මත ගාස්තු අය කිරීමකින් තොරව ගාල්ල වරාය තුළ පිහිටි නිවාඩු නිකේතනයේ කාමර වෙන් කරවා ගත හැකිය.
2. රාජකාරී අවශ්‍යතාවයන් සඳහා යොදවන නිලධාරීන්ට එම දිනයන්වලදී ගාල්ල රුමස්සල සංචාරක බංගලාවේ එක් කාමරයක් ලබා ගත හැකිය.
3. ත්‍රිකුණාමලය වරායේ හා එම ප්‍රදේශයේ කිසියම් රාජකාරියක් සඳහා යොදවන නිලධාරීන්හට ත්‍රිකුණාමලය ඕරිස් නිවාඩු නිකේතනයේ ඇති කාමර දෙක(02)ක් වෙන් කර ගත හැකි අතර සේවකයින් සඳහා ත්‍රිකුණාමලය වරාය මගින් පාලනය වන Town Office නිකේතනයේ නවාතැන් පහසුකම් ලබා ගත හැකිය.
4. අනෙකුත් සංචාරක බංගලාවලද රාජකාරී අවශ්‍යතාවයන් සඳහා යෙදෙන නිලධාරීන්/ සේවකයින් සඳහා කාමර වෙන් කරවා ගැනීමේ හැකියාව ඇත.

සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ අනුමැතිය මත ඉහත අංක 02 හා 03 හි සඳහන් පරිදි සංචාරක බංගලාවල කාමර ලබා ගැනීමේදී එක් කාමරයක් එක් රාත්‍රියකට රු. 75/- බැගින් අයකර ගනු ලැබේ. (මෙම ගාස්තු සඳහා SSCL හා VAT එකතු කරනු ලැබේ)

තවද, ත්‍රිකුණාමලය වරාය මගින් පාලනය වන Town Office හි නවාතැන් පහසුකම් නේවාසික කළමනාකරු (ත්‍රිකුණාමලය) මගින් ද ඉහත අංක 01, 02 හා 03 හි සඳහන් පරිදි සංචාරක බංගලාවල කාමර online මගින්ද වෙන් කර ගත යුතු බව දන්වා සිටිමි.

**අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික)**
**සභාපති**
2025. 07.3 දින

පිටපත්: 1.උප සභාපති
2. කළමනාකාර අධ්‍යක්ෂ
3.අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)/(මාසක හා පරි.)/ (තාක්ෂණ)
4. නේවාසික කළමනාකරු (ත්‍රිකුණාමලය) - අවශ්‍ය කටයුතු සඳහා